# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (විසිවන කණ්ඩායම)
## ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව(නවවන කණ්ඩායම)- 2025

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය මඟින් 2025 වර්ෂයේ පැවැත්වීමට නියමිත ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලා/ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට කැමැති අපේක්ෂකයන්ගෙන් 2025.04.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ඉංග්‍රිසි භාෂා සහතික පත්‍ර/උසස් සහතික පත්‍ර පාඨමාලා

02. ඉංග්‍රිසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව

02. ඉංග්‍රිසි භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්:**

**ඉංග්‍රිසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව**

- 9 ශ්‍රේණිය සමත් වයස අවුරුදු 16 සම්පූර්ණ කළ ඉංග්‍රිසි භාෂාව ඉගෙනීමට උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට අයදුම් කළ හැකිය.

**ඉංග්‍රිසි භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව**

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ඉංග්‍රිසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව සමත් වීම.

  **හෝ**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත් වීම හෝ ඊට සමාන සුදුසුකමක් සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් සමත් වීම.

**ඉංග්‍රිසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - SLQF Level 3 - 30 Credits**

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ඉංග්‍රිසි භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව සමත් වීම.

  **හෝ**

- අ.පො.ස. අ.පො.ස. (උසස් පෙළ) විභාගය හෝ ඊට සමාන සුදුසුකමක් සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් සමත් වීම.

  **හෝ**

- අවම වශයෙන් වසර 12 ක පාසල් අධ්‍යාපනයෙන් පසු **SLQF** මට්ටම 2 ට සමාන පදනම් පාඨමාලාවක් සහ ඉන් පසුව යෝග්‍යතා පරීක්ෂණයකින් සමත් විය යුතුය.

**ඉංග්‍රිසි භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව - SLQF Level 04 – 30 Credits**

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ඉංග්‍රිසි ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම.

  **හෝ**
- අ.පො.ස. (උසස් පෙළ) විභාගය හෝ ඊට සමාන සුදුසුකමක් සහ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් **SLQF** මට්ටම **3** ට සමාන ඉංග්‍රිසි භාෂා ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**පාඨමාලා ආරම්භය :** 2025 ජුනි
**පාඨමාලා කාලය -** සෑම පාඨමාලාවකම කාලය වසර එකකි
සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා

**පාඨමාලා ගාස්තු :**

| | | |
|---|---|---|
| සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 20,000/- |
| උසස් සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 25,000/- |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | - | රු. 32,500/- |
| ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව | - | රු. 42,000/- |

**(පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ලියාපදිංචි වන අවස්ථාවේදී ය විශ්වවිද්‍යාලය වෙත මේ සම්බන්ධව ගෙවූ කිසිදු මුදලක් ආපසු නොගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

**තෝරා ගැනීම**

සුදුසුකම් සපුරන ලද සුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනේ.

**පාඨමාලා කාලය :** කාලය වසර එකකි

**පාඨමාලා ආරම්භය : 2025 ජුනි**

**ස්ථානය:** ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ගුරුළුගෝමී මාවත, පිටිපන උතුර, හෝමාගම.

කාලය : සෑම සෙනසුරාදා දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා

**අයදුම්පත් ලබාගත හැකි ආකාරය :**

දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත 2025.04.30 දින දක්වා ප.ව. 3.00 ට පෙර අංක **214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයට** ඉදිරිපත් කිරීමෙන් අයදුම්පත් හා විස්තර ලබා ගත හැකි ය.

තැපැල් මගින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9"x 4" ප්‍රමාණයේ රු. 110/-ක මුද්දර ඇලවූ කවරයක් 2025.04.20 දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකි ය.

**චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **පාඨමාලාවේ නම සඳහන් කර - "ඉංග්‍රීසි ඩිප්ලෝමා අයදුම්පත්‍ර ලබා ගැනීම යනුවෙන්"** සඳහන් කළ යුතු ය.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**නො. 214, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය.

**සැ.යු.** එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට 'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය' නමින් රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග ඉදිරිපත් කළ යුතු ය.

**බැංකුවට මුදල් ගෙවීමේ දී තමාගේ නමට ඉදිරියෙන් "E/Dip "යන සංකේත අංකය භාවිතා කළ යුතුය.**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025 අප්‍රේල් මස 30** වන දින වේ. එදිනට පෙර නිසියාකාර ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් උක්ත ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

වැඩි විස්තර: 011-2580609, 011-2502944, 011-2593604
පාඨමාලා සමායෝජක : 070-1911917

ලේඛකාධිකාරී (වැ.බ)
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
නො. 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07
2025.03.06